දෙවිනුවර ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.

---------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 17 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයට අදාළව ලැබී තිබූ රු.205,500 ක්වූ ගොඩනැගිලි කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | කුලී ලේඛනයේ ශේෂයත් ලෙජර් ගිණුමෙහි ශේෂයත් අතර අසමානතාව ඉවත් කිරීමට අදාල ගැලපීම්ද සමාලෝචිත වර්ෂයේ ජ'නල් සටහන් අංක 21 මගින් එක්වර ගිණුම් තබා ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයන් 09 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වූ රු. 6,724,721 ක වෙනස හඳුනාගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට ගැලපීම කර තිබුණි. ඒ අනුව සමුච්චිත අරමුදලේ ශේෂය රු.2,896,755 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අසමානතාවය ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ සාරාංශ ආදායම් ලේඛණය අනුව රු.1,267,628 ක්වූ වරිපනම් හා බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.1,900,028 ක් ලෙස දැක්වීම නිසා වරිපනම් බදු ආදායම රු.632,400 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ, ප්‍රවර්තන හා ඉදිරි ලැබීම් වශයෙන් තීරු 03 ක් පවත්වා ගැනීමෙන් සිදුවූ දෝෂයකි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි යටතේ රු.113,789 කින් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.11,231,221 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.896,123 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ වෙනසට හේතු සොයා ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.126,518,671 ක්වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව තුලනය කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තැන්පත් ලේඛන මාසිකව තුලනය කර ප්‍රධාන ලෙජරයේ ශේෂ සමග සසඳමින් විධිමත්ව පවත්වා ගෙන යන ලදී. |
| (ii) රීති 177 | ටෙන්ඩර් කැඳවීමකින් තොරව ඇසළ සල්පිල් තාවකාලික කඩ සහ බිම් අල්ලි ලබාදීම සිදු කර තිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2017 වර්ෂයේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අනුව කටයුතු කිරිමට සැලසුම් කළද ප්‍රධාන අමාත්‍යාගේ නියෝගය හා කමිටු නිර්දේශය අනුව එම ක්‍රමවේදය අතරමඟ නතර කර දැමීමට සිදුවිය. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රය | | | |
| (i) මු.රෙ. 571 | වර්ෂ 02 ක කාලයක් ඉකුත් වූ එකතුව රු.938,554 වූ ගෙවිය යුතු රැඳවුම් තැන්පතු ශේෂ 174 සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මු.රෙ. 571 ප්‍රකාරව ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු සිදුකරමි. |
| (ii) මු.රෙ. 1646 | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 20 කට අදාල දෛනික | මුදල් රෙගුලාසි ප්‍රකාරව | 2020 වර්ෂයේ සිට අදාළ ධාවන සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කටයුතු කළයුතු වේ. | |
| (ඇ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු කැබ් රථ දෙකෙහි ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉන්ධන දහන පරීක්ෂාව ඉදිරියේ දී සිදු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,245,653 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,370,631 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,499,983 | 2,902,626 | 2,469,962 | 4,351,359 | 2,259,839 | 5,662,880 | 5,906,246 | 3,918,695 |
| කුලී | 23,588,050 | 20,514,087 | 18,487,926 | 11,189,509 | 20,013,272 | 22,551,481 | 23,094,744 | 9,163,348 |
| බලපත්‍ර ගාස්තු | 4,215,350 | 5,205,966 | 5,105,266 | 100,700 | 3,949,486 | 860,113 | 860,113 | -- |
| වෙනත් ආදායම් | 31,292,000 | 37,431,875 | 15,839,840 | 87,732,673 | 21,188,620 | 65,059,111 | 52,844,873 | 66,140,638 |
| **එකතුව** | 61,595,383 | 66,054,554 | 41,902,994 | 103,374,241 | 47,411,217 | 94,133,585 | 82,705,976 | 79,222,681 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,936,164 ක් වූ අතර, රු.1,995,992 ක් වූ වර්ෂයේ බිල්කිරීම් (දඩ සමඟ) සමග රු.5,932,156 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,580,797 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,351,359 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ මුදල් ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | වරිපනම් ගාස්තු අය කිරීම සඳහා පරිගණකගත කර ඇති මෘදුකාංගයක් භාවිතා කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,409,430 ක් අයවිය යුතුව තිබූ අතර වර්ෂයේ මුළු අයවීම් රු.1,315,756 ක් සහ ලබාදුන් රු.66,586 ක වට්ටම අඩුකල විට 2019 දෙසැම්බර් 31 දිනට රු.4,027,094 ක් හිඟව පැවතුනද ලබාගත් පරිගණක මුද්‍රිත සටහන් අනුව පෙන්නුම් කරන හිඟය රු. 3,755,494 ක් බැවින් රු.251,600 ක වෙනසක් පැවතුණි. | කඩිනමින් වෙනස්වීම හඳුනාගෙන ගැලපීම් කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | ආරම්භක හිඟය රු.58,686 ක් වූ අතර රු.6,641 ක්වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.65,327 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් රු.2,130 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.63,197 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 බදු කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ආරම්භක හිඟ කුලී ශේෂය රු. 9,100,843 ක් වූ අතර, රු.4,722,964 ක් වූ වර්ෂයේ බිල්කිරීම් | හිඟ ආදායම් කඩිනමින් අයකර | හිග අයකර ගැනීම් සමථ මූලා |

| | | | |
|---|---|---|---|
| | සමග රු.13,823,807 ක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු අයවීම් රු.3,528,957 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,294,850 ක් හිඟව පැවතුණි. | ගත යුතු වේ. | මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | දෙවිනුවර ප්‍රාදේශීය සභාව කඩ කාමර 105 මාසික බදුකුලී පදනම යටතේ බදුදී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,010,251 ක් හිඟව පැවති අතර ඉන් රු.59,000 ට වැඩි හිඟ කඩකුලී අයවීමට තිබූ කඩ කාමර 08 න් රු. 736,168 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. |

**2.2.4 වෙනත් ආදායම්**

------------------

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.1,299,254 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 85,565,090 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අය කර ගැනීම සඳහා විටින් විට ඉල්ලීම් කර ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ----------------- |
| සභා බල ප්‍රදේශයේ මාසිකව ජනනය වන දිරන හා නොදිරන කසල ටොන් 90 ක් පමණ මාතර ප්‍රාදේශීය සභාවට අයත් වගුරු බිමකට බැහැර කෙරෙමින් පැවතුණි. | විධිමත් ලෙස කසල බැහැර කළයුතු වේ. | දැනට දිරන කසළ හා නොදිරන කසළ ලෙස වර්ගීකරණය කොට එකතු කිරීම සිදු කරන අතර දිරන කසළ පමණක් බැහැර කිරීම සිදු කෙරේ. |

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 වර්ෂයේ රුහුණු උදානය සංවර්ධනය වැඩසටහන යටතේ ගන්දර සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම ගොවි සංවිධානයට පවරා 2015 නොවැම්බර් 26 දින අවසන් කළ බවට නිම්වැඩ වාර්තා සකස් කර රු.1,271,174 ක් ගෙවා තිබුණද 2020 පෙබරවාරි 28 දින වන විටත් වැඩ නිමකර ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ඉදිකිරීම් කඩිනමින් අවසන් කර එලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතු වේ. | සභාවට ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් එම ප්‍රතිපාදන ලද විගස මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට කටයුතු කරමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙවිනුවර ඇසළ සල්පිලේ තාවකාලික කඩ සහ බිම් අල්ලි බදු පදනම මත ලබාදීමේදී නිශ්චිත සැලැස්මකට අනුව වෙන් කර නොතිබූ අතර වර්ෂ 5 කට පෙර තත්ත්වයන් සලකා බැලීම නිසා නව ගැණුම්කරුවන්ට කඩ මිලදී ගැනීමේ අවස්ථාව අහිමිවීම හේතුවෙන් කඩ කාමර 112 කින් රු.2,332,150 ක ආදායමක් සභාවට ලැබී නොතිබුණි. | නිශ්චිත සැලැස්මක් සකස් කර නිසි පරිදි ටෙන්ඩර් කැඳවා බදුදීම කළයුතු වේ. | එකම නිශ්චිත සැලැස්මකට අනුව සල්පිල් භූමියේ තාවකාලික කඩ හා බිම් අල්ලි වෙන් කිරීමක් සිදු කළ නොහැකි අතර විවිධ හේතූන් මත එය වෙනස්වීම් සිදු වේ. තවද රටේ පැවති වාතාවරණය මත සල්පිල් භූමියේ කඩ කාමර අලෙවි කිරීමේ අවදානමක් තිබුණි. |
| 2019 වර්ෂය වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 28 ක් මගින් පරිසරයට වන හානිය පිළිබඳව අවධානය යොමු වී නොතිබූ අතර, බලපත්‍ර ගාස්තු හා පෙරසැරි ගාස්තු වශයෙන් රු.196,000 ක් අයකරගෙන නොතිබුණි. | සුදුසුකම් පරීක්ෂා කර පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී එම ආයතනවලට බලපත්‍ර ලබාදීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කර ගැනීමට හා 37 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ක සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කරමි. |
| (ආ) | බඳවාගෙන තිබූ සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන්ට නියමිත රාජකාරී පැවරීමක් සිදු නොකිරීම, ආදේශක පදනම මත නැවත සේවකයින් බඳවා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.4,613,760 ක අතිරේක වැය දැරීමට තිබුණි. | නියමිත රාජකාරියේ යෙදවිය යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇසළ සල්පිල් කටයුතුවලට අදාළව වෙළඳ කටයුතුවල නිරත වූ තාවකාලික කඩ කාමර හා බිම් අල්ලි 84 කින් රු.2,026,800 ක කඩකුලී මුදල් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විකුණා නොමැති අනෙකුත් සියළුම තාවකාලික කඩ හා බිම් අල්ලි වල අනවසරයෙන් රැදී සිටි ජංගම වෙළඳුන් නිරන්තරයෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර 97 කින් 2019 වර්ෂය සඳහා රු.90,850 ක ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සමාලෝචිත වර්ෂය සඳහා අය විය යුතු ව්‍යාපාර 95 ක් සඳහා නඩු පවරා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සහා බල ප්‍රදේශයේ ප්‍රදර්ශන කර තිබූ දැන්වීම් පුවරු 33 ක් වෙනුවෙන් රු.145,050 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | කඩිනමින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා අයවිය යුතු දැන්වීම් පුවරු 33 සඳහා නඩු පවරා ඇත. |
| (ඈ) | සභාව සතු ටෙරක්ස් 820 බැකෝ යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදී සිදුවූ අනතුරින් පිටුපස පැති වීදුරුව බිඳී ගොස් තිබූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්රකාරව කටයුතු කර අදාළ පුද්ගලයින්ගෙන් අලාභ අයකිරීමට වගකිවයුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාළ ආයතන සමඟ සාකච්ජා කර ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ඉ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස අ/5/6/ පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර 49 ක් වෙනුවෙන් ගිවිසුම් වර්ෂ 03 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කඩ කාමර කුලි තක්සේරු වාර්තා අනුව ගිවිසුම් ගත වන ලෙස දන්වා ලිපි මඟින් දැනුවත් කිරීම් කර ඇති අතර සිහි කැඳවීම් ලිපි යොමුකර ඇත. |